

# ජලාශ පතුලේ සැඟව ගිය යෞවන සිහිනය



සංවාද සටහන
ශ්‍රීලාල් සෙනෙවිරත්න

පෙම්වතුන්ගේ දිනයට දින දෙකකට කලින් මට ලැබුණා බොහොම සුන්දර හැඟීමක් ඇති කළ කෙටි පණිවිඩයක්. ඒකේ තිබුණේ අනිද්දා, ඒ කියන්නේ පෙම්වතුන්ගේ දිනය දා හවස තුනට ගල්කිස්සේ මුහුදු වෙරළට එන්න කියලා පෙම්වතුන්ගේ දිනය සමරන්න. ගල්කිස්ස උසාවිය අයිනෙන් තියන පාර දිගේ මුහුදු වෙරළට එන හැටිත් කියලා තිබුණා. තරුණ සංවිධානයක් කිසියම් උත්සවයක් සංවිධානය කරලා. ඒ සුන්දර අවස්ථාවට එක් වෙන්න ඕනේ කියලා මට හිතුණා.

ටික වෙලාවකට පස්සේ තවත් කෙටි පණිවිඩයක් ලැබුණා. 'වාරියපොල දැදුරු ඔය ජලාශය අසළදී අතුරුදහන්ව සිටි පාසල් පෙම් යුවලේ පෙම්වතාගේ සිරුර හමුවේ' කියලයි ඒකේ තිබුණේ. ගිනියම් ඊයම් බරුවක් පපුව තුළට කිඳා බසිනවා වගේ වේදනාවක් සිත පුරා පැතිරිලා ගියේ පෙම්වතුන්ගේ දිනය ගැන දැකපු සුන්දර සිහිනය කීතු කීතු කරමින්.

ඒකෙන් පස්සේ දැදුරු ඔයට පැන්න පාසල් පෙම් යුවළේ කතන්දරය විවිධ මාධ්‍යවලින් විවිධ විදිහට ගොඩදාන්න පටන් ගත්තා.

"ජලාශ වේල්ලේ සිට මීටර් 80ක් පමණ ගැඹුරු ස්ථානයක තිබී මළ සිරුර හමුවී තිබේ.
එම මළ සිරුර කුඹුක්ගැටේ මහා විද්‍යාලයේ 12 වසරෙහි ඉගෙනුම ලබමින් සිටි ආර්.එම්. තරිඳු රත්නායකගේ බවට හඳුනාගෙන තිබේ. ඔහු කුඹුක්ගැටේ බොරළුවැව පදිංචිකරුවෙකි.
මිය ගිය සිසුවාගේ පෙම්වතිය බව කියන 16 හැවිරිදි පාසල් ශිෂ්‍යාවගේ සිරුර ඊයේ හවස් වන තුරුද කිමිදුම්කරුවන්ට හමුවී නොතිබිණි. එම සිසුවිය බිංගිරිය ඉහළ කොස්වත්ත ගාමිණී ආදර්ශ මහා විද්‍යාලයේ 11 වසරෙහි ඉගෙනුම ලැබූ එච්.ඩී. සුභද්‍රා ලෙස හඳුනාගෙන තිබේ.
මෙම පෙම් යුවළ..."

ලංකාදීප පත්තරේ සිදුවීම වාර්තා කරලා තිබුණේ ඒ විදිහට. පෙම් යුවළේ පැටිකිරිය අඩුවක් නොකරම ප්‍රවෘත්ති පිටුවක එළලා තිබුණා. මට හොඳටම මතක සිදුවීමක් එකසැරේම මතකෙට ආවා. මීට අවුරුදු දෙකකට විතර කලින් කොළඹ ජනප්‍රිය විද්‍යාලයක ඉගෙනුම ලබමින් සිටි 10 වෙනි වසරේ සිසුවෙක් එකම පන්තියේ සහෝදර ශිෂ්‍යයෙකුට පිහියෙන් ඇනලා මරලා තිබුණා. මිය ගොස් තිබුණේ ගොඩගම පදිංචි සිසුවෙක්. පිහියෙන් ඇනපු ශිෂ්‍යා පොලිසිය අත්අඩංගුවට ගෙන තිබුණා. මේ සිදුවීම ගැනත් පත්තර පිටු පුරා විස්තර පළවුණා. ඒත් කිසිම තැනක ඔවුන් ඉගෙන ගත්ත පාසලේ නම සඳහන් වෙලා තිබුණේ නෑ. ඒ ගැන මම කියවපු හැම පත්තර පිටුවකම තිබුණේ "කොළඹ ජනප්‍රිය පාසලක" කියලා. මම ඒ මළ ගෙදරට ගියේ සුදු කොඩි පාරේ. මොකද පදිංචිය ගැන ලියලා තිබුණොත් "ගොඩගම ප්‍රදේශයේ" කියලා විතරක් නිසා හොයාගන්න ටිකක් අමාරු වුණා.

ඒකෙන් පස්සේ ඒ වගේ තවත් සිදුවීම් මතකෙට එන්න පටන් ගත්තා. රොස්මිඩ් පෙදෙසේ බාලිකා විද්‍යාලයක ශිෂ්‍යාවක් විද්‍යාලයේ වැසිකිළියක් තුළ සිය දිවි නසාගෙන තිබුණ සිදුවීමත් ආන්දෝලනාත්මක සිදුවීමක් වුණා. ඒ ගැන වාර්තා කළ මාධ්‍යයත් කිසිම අවස්ථාවක ඒ විද්‍යාලයේ නම සඳහන් කරලා තිබුණේ නෑ. කොළඹ ශිෂ්‍යන-'ටයි ඒ අය ඉගෙන ගන්න පාසල්වලටයි තියන මොකක් හරි දෙයක් පිටිසර දුප්පත් ශිෂ්‍යයන්ටයි ඒ අය ඉගෙන ගන්න පාසල්වලටයි නැතිව ඇති. ඇත්තටම මොකක්ද ඒ 'නැති' දේ? ජන මාධ්‍යවල අයට මේ ගැන පැහැදිලි කිරීමක් කරන්න පුලුවන් නම් හොඳයි.

සිය දිවි නසා ගැනීම් වාර්තාකරණය කියන්නේ ජනමාධ්‍යයේ විශේෂයෙන් අවධානයට ලක්වුණු අංගයක්. සිය දිවි නසාගැනීම් වර්ධනයට මාධ්‍ය වාර්තාකරණය බලපානවා කියලා ඒ ගැන කළ පර්යේෂණවලින් අනාවරණය කරගෙන තියනවා. 1995 අවුරුද්දේ ලෝකයේ සිය දිවි නසාගැනීම් වැඩිම රට විදිහට ශ්‍රී ලංකාව වාර්තාවක් තැබුවා. මට මතක හැටියට හැම පැයකටම එක් අයෙක් සිය දිවි නසා ගන්න තත්ත්වයක් තිබුණේ. මේ විදිහට සමාජ ප්‍රශ්ණයක් බවට සිය දිවි නසාගැනීම් පත්වුණාට පස්සේ ඒ වෙනුවෙන් හොයා බලලා නිර්දේශ ඉදිරිපත් කරන්න විශේෂ ජනාධිපති කමිටුවක් පවා පත් කරන්න එවක හිටිය ජනාධිපතිවරිය ක්‍රියා කළා. මාධ්‍යවේදීන්ට පුහුණු වැඩමුළු පැවැත්තුවා. තවත් බොහෝ වැඩසටහන් ක්‍රියාත්මක වුණා.

ඒවායේ ප්‍රතිපලයක් විදිහට ලංකාවේ සිය දිවි නසාගැනීම් ලෝක වාර්තා මට්ටමෙන් පහළට වැටුණාත් අදටත් ලංකාව කියන්නේ සිය දිවි නසා ගැනීම් බෙ-හෙවින් ඉහළ මට්ටමක තියන රටක්. මේ තත්ත්වය වෙනස් කරන්නට හඳුන්වා දුන් විවිධ ක්‍රමෝපාය අතරේ තිබුණා සිය දිවි නසා ගැනීම් වාර්තා කිරීමේදී මාධ්‍ය අනුගමනය කළ යුතු මගපෙන්වීම් මාලාවක්. එහි ඇතුළත් වූ පිළිවෙත් සියල්ලේම අරමුණ වුණේ වාර්තාකරණය මගින් තව කෙනෙක් සිය දිවි නසා ගැනීමකට පෙළඹීමට තියන ඉඩ අඩු කරගැනීම. ඒත් මාධ්‍යයට එහෙම එකක් තියනවාද කියලවත් අමතක වෙලා බවයි මේ සිදුවීම් වාර්තා කරන විදිහෙන් පෙ-නෙන්නේ.

මේ සිදුවීමට අදාළ මාධ්‍ය වාර්තා කිරීම් කියවමින් යන අතරේ එක්තරා වෙබ් අඩවියක මේ සිදුවීම ගැන තිබුණු 'කමෙන්ට්ස්' ටිකකුත් කියවන්න මට හිතුණා. එකින් එක ඒවා කියෝගෙන යන කොට මට ඇති වුණේ විශ්මයක්. හැම කමෙන්ට්ස් එකකින්ම වගේ මේ පෙම් යුවළ නිර්දය ගර්හාවට ලක් කරලා තිබුණා. "කාලකණ්ණි", "ඔහොම වුන් මැරෙන එකමයි හොඳ", "මුන්ට තෙල වැඩිවෙලා, ඒකයි". මේ විදිහට ද්වේශ සහගතව ලියපු කමෙන්ට්ස් තමයි පිරිලා තිබුණේ.

දිවි නසා ගත්ත පෙම් යුවළ තවමත් සාමාන්‍ය පෙළ මට්ටමේ ඉන්න නොමේරූ යෞවනයන්. ගැටළුවක් හඳුනාගන්න අපොහොසත්, විචාරය කරගන්න අපො-හොසත්, විකල්ප හොයන්න කොහොමත් අපො-හොසත් වයසක්. 'පොඩි එවුන් දෙන්නෙක්'. එහෙමයි මට හිතෙන්නේ. ඇයි පොඩි වුන් මේ විදිහට හැසි-රෙන්නේ. වුන්ට නිවැරදි මග පෙන්වීමක් කරන්න අසමත් අසම්ජාති, කුහක මහ එවුන් ගෙන් පිරුණු සමාජයක වුන් හුදකලා වෙලා ඉන්න නිසා නෙ-වෙයිද?

යොවුන් වියට පිවිසෙන තරුණ තරුණියන්ට ප්‍රේමණීය සිතිවිලි ඇතිවීම කියන්නේ සම්පූර්ණයෙන්ම ස්වාභාවික මනෝ කායික ක්‍රියාවලියක්. ඒ දේ එහෙම වෙන්නේ නැත්නම් එතනයි අවුල තියෙන්නේ. ඒත් ඒකට මේ 'ශුද්ධ-වන්තයන්ගේ' සමාජය දක්වන ප්‍රතිචාරය මොකක්ද? දෙමව්පියන්ගේ ගුරුවන්ගේ ඉඳලා කිසිම දැන හැඳුනුම් කමක් නැති ආගන්තුකයා දක්වා යොවුන් ප්‍රේමය දකින්නේ මහා අපරාධයක් විදිහට. ප්‍රේමවන්තයන් කියන්නේ බරපතල අපරාධකරුවන් විදිහට. කුරුණෑගල පොලිසියේ මහත්තුරු බැටන් පොලු කෙලින් කරගෙන ගිහින් වැව රවුමේ හරි කො-හේ හරි ඉන්න තරුණ ජෝඩු පොලිසියට දක්කගෙන ඇවිල්ලා මහ ලොකුවට මාධ-‍්‍යයට පම්පෝරි ගහන අවස්ථා අපි කොච්චර නම් දැකලා තියනවාද? 'ටියුෂන් ඇවිත් පෙම් කෙළලා'. මාර අපරාධයක්.

පත්තරේක තිබුණා මිය ගිය තරිඳු තරුණියක් සමඟ සිටිනවා ගමේ පුද්ගලයෙකු දැක තිබුණ කතාවක්. ඒ වෙලාවේ තරිඳු හැංගුණාලු. ඔව් වෙන මොනව කරන්නද හැංගෙනවා ඇර? අයි මහා අපරාධයක් නේ කරලා තියෙන්නේ. දැන් මේ පනිවිඩේ ගෙදරට ගියාම මට හවස ගෙදර යන්න වෙන්නෑ කියලා තරිඳුට හිතුණා නම් ඒකේ ඇති වරද මොකක්ද? ඒක තමයි ඇත්ත. කොල්ලෙක් කෙල්ලෙක් ලංවෙලා කතා කර කර ඉන්නවා ගමේ මිනිහෙක් දැක්කොත් ගෙදර යන්න වෙන්නේ නෑ. ඊළඟට ඉස්කෝලේ යන්න වෙන්නේ නෑ. පාරේ බැහැලා යන්න වෙන්නේ නෑ. පොලිසියට ගිහින් ලිංගිකත්වය ගැන පොලිසියෙන් පාඩම් ඉගෙන ගන්නත් සිද්ධ වෙන්න බැරි නෑ. ඒක නෙවෙයිද ඇත්ත. තරිඳුයි සුභද්‍රයි දැදුරු ඔය ජලාශයට යන්න ඇත්තේ ඒ නිසා නෙවෙයිද?

ඇත්තටම තරිඳුයි සුභද්‍රයි සිය දිවි නසාගත්තද? නෑ. මේ යෞවන පෙම් යුවළ ඝාතනය කළා. ඔව්. මේ පොඩි වුන් දෙන්නව ඝාතනය කළා. ඒ ඝාතකයන් නිදැල්ලේ ඉඳගෙන දැන් කමෙන්ට්ස් කරනවා. ඇත්තටම කවුද කාලකණ්ණි? කවුද මැරෙන්න ඕනේ වුන්?

---

7 වන පිටෙන්

ආකාරයේ චිකන් කරියක් සාදන්නට අවශ්‍ය ද්‍රව්‍ය ලයිස්තුව සහ සාදන ක්‍රමය ඇතුලත් පත්‍රිකාවක් හෙවත් රෙසිපියක් මුද්‍රණය කර ගන්නට හැකිවිය. අවශ්‍ය කළමනා සියල්ල සූදානම් කරගෙන ඒ සතියේ සෙනසුරාදා හවස් වරුවේ ඔහු කුස්සියට ගියේ "අද චිකන් කරි සාදා රමණී නෝනා විශ්මයට පත්කරවම්" ය යන අදිටනෙනි.

මුලින්ම කළ යුතුව තිබුණේ කුකුල් මස් කැබලිවලට කපා, ලුනු, කහ, විනාකිරි, යෝගට් යනාදිය මිශ්‍ර කර ශීතකරණයේ පැය භාගයක් පමණ තැබීමටයි. ඉන් පසු නියමිතව තිබුණේ, කපා ගත් බොම්බයි ලූණු, මිරිස් කුඩු, ඉන්දියානු තුනපහ කුඩු එකට මිශ්‍ර කර මදක් තෙලෙන් බැද ගැනීමටයි. එම මිශ්‍රණය ලිපෙන් බා "කීප්-අ-සයිඩ්" නැතහොත් පසෙකින් තබන්න යනුවෙන් කෑම වට්ටෝරුවේ ලියවී තිබුණි.

ඉහත දෙපියවර සම්පූර්ණ කළ රත්නායක මහත්තයා ඊළඟට රෙසිපියේ තුන්වෙනි පියවරට පිවිස, ශීතකරණයේ තිබූ මස් රැගෙන, එයට කරපිංචා, කුරුඳු, යනාදී ද්‍රව්‍ය කිහිපයක් එකතු කර මුලින් මදක් තෙම්පරාදු කර ඉන් පසුව වතුර එක් කර උයන්නට විය.

මිනිත්තු විස්සක් පමණ මද ගින්නේ උයාගත යුතු බව රෙසිපියේ සඳහන් වී තිබුණි.

හරියටම ඒ විනාඩි විස්ස ගෙවෙන විට ම වාගේ රමණී නෝනා සේවය නිමවා නිවසට පැමිණියාය.

"ආ රත්නේ ඔයා උයන්න පටන් ගත්තද? මොනවද මේ ලිපේ?" ඇය කුස්සියට පිවිසුනේ එළෙස විමසමිනි.
"මං අද හදන්නේ අර අපි ඉන්දියන් රෙස්ටෝරන්ට් එකෙන් කාපු චිකන් ජාතිය. රෙසිපි එක ඉන්ටර්නෙට් එකෙන් ඩවුන්ලෝඩ් කර ගත්තා. දැන් ඉදිලා ඉවර ඇති මයෙ හිතේ!" රත්නායක මහත්තයා ආඩම්බ-රයෙන් පැවසීය.

"කෝ බලන්න, කෝ බලන්න!" කියමින් රමණී නෝනා ලිප උඩ ඉදෙමින් තිබූ සාස්පානේ මූඩිය හැර බැලුවා ය.
"කෝ රත්නේ, මේකේ වැඩි සුවඳක් නෑ නේ. අනික හොද්දේ පාටත් නිකං අමුතුයි. ඔයා මේකට මිරිස් හෙම දැම්මේ නැද්ද?"

"මං සේරම රෙසිපියේ තිබුණු විදියට අකුරක් නෑර කළා!" රත්නායක මහත්තයා නොබියව කියා සිටියේය.

"ඔහොම තමයි එහෙනං මේ රෙසිපියෙන් ඔය චිකන් කරි එක හැදෙනවා ඇත්තේ."

වට පිට බැලූ රමණී නෝනා ගේ නෙත ගැටුණේ දිසියක දමන ලද තෙම්පරාදු කරන ලද මිශ්‍රණයකි.

"මේ මොනවද රත්නේ මේ?" ඇය ඇසුවාය.

ඒ දෙස බැලූ රත්නායක මහත්තයා ට හීන් දඩිය නොදැම්මා පමණි.

"මළ කෙලියයි!" ඔහුට ඉබේම කියවිණි. "අර මික්ස් කරලා, තෙම්පරාදු කරලා, ඊට පස්සේ කීප්-අ-සයිඩ් කරපු ඒවා කරි එකට දැම්මේ නෑ නේද?"

තමා අතින් මේ වරද සිදුවූයේ කෙලෙසදැයි සොයා බැලූ රත්නායක මහත්තයාට තේරුම් ගියේ මිශ්‍රණය තෙම්පරාදු කර "කීප්-අ-සයිඩ්" කියා රෙසිපියේ කියා තිබුණාට, එය මස් හොද්දට එකතු කරන්නට ය කියා කිසි තැනක සඳහන්ව නැති බවයි.

කෙසේ හෝ වේවා, රමණී නෝනා ගේ වාසනාවට මෙන්, රත්නායක මහත්තයාට ඉවුම් පිහුම් සඳහා ඇති උනන්දුව මේ කුකරි පාඩමින් පසු තවත් වැඩි වුණා මිස අඩු වූයේ නම් නැත!

අද වන විට රත්නායක මහත්තයා චිකන් කෝර්මා, චිකන් ටික්කා මසාලා, චිකන් රෝගන් ජොෂ් පමණක් නොව, බටර් චිකන් ඉවීමට ද කෙළ පැමිණියෙක් බව රමණී නෝනා පවසන්නී ය.